# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,073 — 1960 මාර්තු 4 වැනි සිකුරාද — 4.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 183 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 186 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 188 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 201 | විවිධ දැන්වීම් ... ... ... | 201 |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ තිසි බලධාරියාගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

### හම් සහ පන් කර්මාන්ත වැඩපලවල දෙවෙනි ශ්‍රෙණියේ කළමනාකාර තනතුරු

ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හම් සහ පන් කර්මාන්ත වැඩපලවල දෙවෙනි ශ්‍රේණියේ කළමනාකාර තනතුරු සඳහා අයදුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. අයදුම් පත් පහත දැක්වෙන ආකෘතියේ ප්‍රකාර පිළියෙළ කොට, කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන වෙත 1960 මාර්තු 28 දින හෝ එයට පෙර ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප්.**—මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය වූ කලී රු. 1,620—120—රු. 3,780 වේ.

3. **සුදුසුකම් :**

(අ) 1960 මාර්තු 28 වෙනි දිනට තමාගේ වයස අවුරුදු 25 ට නොඅඩු බවටත්, අවුරුදු 40ට නොවැඩි බවටත් ;

(ආ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් වී ඇති බවටත් ;

(ඉ) කාර්මික ආයතන භාරව කටයුතු කිරීම, ඒවා පරීක්ෂාකිරීම හා පාලනය සම්බන්ධයෙන් පළපුරුද්දක් ලබා ඇති බවටත් ;

(ඊ) හම් සහ/හෝ පන් වැඩ කර්මාන්ත පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් සහ දැනීමක් ඇති බවටත් සහතික ඉදිරිපත් කළ යුතුය.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—මෙකී තනතුරු තාවකාලික සහ විශ්‍රාම වැටුප් රහිත ඒවාය.

5. අයදුම්කරුවන් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතික පත්වල පිටපත් (මුල් ලිපි නොව) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බවුතිස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සම්බන්ධයෙන් නිකුත් කරන ලද සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රය.

(ඇ) කාර්මික ආයතන භාරව කටයුතු කිරීම, ඒවා පරීක්ෂා කිරීම හා පාලනය සම්බන්ධයෙන් පළපුරුද්දක් ලබා ඇති බව ඔප්පු කිරීමට අදාලවන සහතික.

(ඇ) හම් සහ/හෝ පන් වැඩ කර්මාන්ත පිළිබඳ ප්‍රයෝගික පළපුරුද්දක් සහ දැනීමක් ඇති බව ඔප්පු කිරීමට අදාල වන සහතික.

(ඉ) තම චරිතය, මෙම තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය යන මේවා පිළිබඳව මෑතකදී ලබාගත් සහතික තුනක්. දැනට රාජ්‍ය සේවාවේ යෙදී සිටින අයට මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර එවීම අනවශ්‍ය ය.

සැ. යු.—සහතික පත්‍රවල සහ චරිත සහතිකවල මෙම පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. මෙම ගැසට් පත්‍රයෙහි I වෙනි කොටසේ II වැනි ඡේදයේ මුල පලවන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධ පොදු කොන්දේසිවලට ද අවධානය යොමුකළ යුතුව ඇත.

7. අයදුම්පත් සහ ඒවා පිළිබඳ අනිකුත් ලියුම්කියුම් කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන වෙත එවිය යුතු සි. ඒවා මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධරයකුගේ පුද්ගලික නමට නොඑවිය යුතු සි.

ඇම්. ඇස්. පෙරේරා,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂකතැන.

1960 පෙබරවාරි මස 25 වන දින,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7.

### අයදුම් පත්‍රය

**හම් සහ පන් කර්මාන්ත වැඩපලවල දෙවෙනි ශ්‍රෙණියේ කළමනාකාර තනතුර—ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව**

1. සම්පූර්ණ නම (අගට යෙදෙන නම මුලින්) :————.

2. තැපැල් ලිපිනය :————.

3. පුරවැසි භාවය—එය ලබාගත්තේ කෙසේද යන වග :—

(අ) උත්පත්තියෙන් ද :————.

(ආ) පරම්පරානුගතව ද :————.

(ඇ) ලියා පදිංචි කිරීමෙන් ද :————.

4. (අ) වයස හා උපන් දිනය :————.

(ආ) විවාහක ද අවිවාහක ද යන වග :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ පියා :————.

(ඇ) ඔහුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(ඇ) ඔහුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

6. ලද උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.

7. පාසලෙන් අස්වූ දිනය හා උගෙන ගත්තේ කවර පාසලක ද යන වග :————.

8. කාර්මික ආයතන භාරව කටයුතු කිරීම පරීක්ෂා කිරීම හා පාලනය සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද :————.

9. හම් සහ/හෝ පන් වැඩ කර්මාන්ත පිළිබඳව ඇති ප්‍රායෝගික පළපුරුද්ද සහ දැනීම :————.

10. පාසලින් අස්වූ දා සිට කළ රක්ෂාවල් හා ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දිනයන් සමඟ :————.

11. කියවීම, ලිවීම, කථාකිරීම හා අර්ථ නිරූපනය පිළිබඳ ප්‍රවීණතාවය :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඉ) ඉංග්‍රීසි :————.

12. වෙනත් සුදුසුකම් පිළිබඳ සියළු විස්තර :————.

13. චරිතය පිළිබඳ සහතික පත් ලබා ගත් තිදෙනාගේ නම් සහ තනතුරු :—

1. ————.

2. ————.

3. ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට අවශ්‍ය වාර්තාකරුවෝ

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වාර්තාකරු අංශයෙහි සේවයට ඉදිරිපත් වන්නට බලාපොරොත්තු වන අයගෙන් ඒ සඳහා අයැදුම් පත් කැඳවනු ලැබේ.

සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ලඝු ලේඛනයෙන් ඉතා උසස් ප්‍රවීණතාවක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වාර්තාකරුවන්ගේ වැටුප් පරිමාණය මෙසේ යි :—

රු. 3,840—180 සහ 240—රු. 5,460

රු. 5,880—300—රු. 6,780

රු. 6,780—360—රු. 8,220

මන්ත්‍රී මණ්ඩලයේ වැඩ කටයුතු භාෂා දෙකකින් සටහන් කර ගත හැකි වාර්තාකරුවන්ට අමතර විශේෂ දීමනාවක් දෙනු ලැබේ.

අයැදුම් කරනු රිසි අය පළමු කොට 1960 මාර්තු මස 10 වන දිනට පෙර ඒ සඳහා අයැදුම් ආකෘති පත්‍රයක් මෙහි පහත අත්සන් කර ඇති තැනැත්තාගෙන් ලබා ගත යුතුය.

පී. බී. රත්නායක,
හැන්සාඩ් සංස්කාරක.

1960 පෙබරවාරි 26,
නියෝජිත මන්ත්‍රී මණ්ඩලය,
කොළඹ 1.

## අල්ලස් කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුව

### පියුන් තනතුර

අල්ලස් කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුවේ පියුන් කෙනෙකුගේ තනතුර සඳහා රජයේ ස්ථිර හෝ තාවකාලික සේවයේ නියුක්ත අයට, ඉල්ලුම් පත්‍ර එවන මෙන් මෙයින් ආරාධනය කරනු ලැබේ.

මෙයට යාකර ඇති නියමිත ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම් පත් 1960 මාර්තු 26 වෙනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබිය යුතුය.

**2. වැටුප්, දීමනාවන් සහ සේවය පිළිබඳ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, මේ තනතුර ඔහු විසින් දරණ තෙක් පමණක් විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට අයත් වැටුප වර්ෂයකට රු. 540න් පටන් ගෙන වර්ෂයකට රු. 12 බැගින් වැඩිවී රු. 804 තෙක් නගී. රජයේ රෙගුලාසි අනුව ජීවන වියදම් හා ගෙවල් කුලී ගෙවනු ඇත.

**3. අයදුම් කරුවන්ට අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් තිබෙන බව ඔප්පුවීමට සාධක දැක්විය යුතුය :—

(අ) තමා විශිෂ්ට චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) සිංහල, ඉංග්‍රීසි ලිවීම සහ කියවීම පුළුවන් බව.

4. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙනි. ස්ථිර තනතුරු දරණ අය විසින් එවන ඉල්ලුම් පත්‍ර, භාරගන්නේ, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන්ගේ නිල වලින් මුදා හැරීමට සූදානම්ය කියා සහතික කලොත් පමණකි. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ට නියමිත දිනට ප්‍රථම භාරදී තිබී, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස හේතු සහිතව නිර්දේශ කළහොත් පමණකි.

5. ඉල්ලුම් කළ විට, අයදුම් කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලි සියල්ලම හෝ ඉන් සමහරක් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බව්තිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා ඇති ව්‍යවස්ථා සංග්‍රහය අනුව නිකුත් කර ඇති උප්පැන්න සහතික භාරගනු නොලැබේ).

(ආ) සමත්වූ ඉහළම විභාගය සම්බන්ධ සහතිකය.

ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම් පත්‍රයට අමුණා නොඑවිය යුතුය.

6. ඉල්ලුම් පත්‍ර හෝ ඊට අදාල ලියුම් එවිය යුත්තේ අල්ලස් කොමසාරිස් තැනට මිස මෙම දෙපාර්තමේන්තුවේ වෙන කිසිම නිලධාරියෙකුට නොවේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ මුල පළවූ රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් වලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

ඒ. ඩබ්ලිව්. එච්. අභයසුන්දර,
වැඩබලන අල්ලස් කොමසාරිස් තැන.

1960 පෙබරවාරි 26 වැනි දින,
කොළඹ, අළුත්කඩේ,
අල්ලස් කොමසාරිස් තැනගේ කාර්යාලයේදීය.

### ආකෘති පත්‍රය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය සහ ජාතිය :————.

(4) අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ඉංග්‍රීසි :————.

(ආ) සිංහල :————.

(ඉ) දෙමළ :————.

(5) දැනට කරන රැකියාව සහ පත්වීම ලැබූ දිනය :————.

(6) වෙනත් විශේෂ සුදුසුකම් :————.

මෙම අයදුම් පත්‍රයේ ඇතුලත් කරන ලද ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. තවද මෙහි ඇතුලත් කිසියම් විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව පත් කිරීමෙන් පසුව දැනගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලබන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### දෙවන පෙළ ජේලර් තනතුරු

බන්ධනාගාර දෙපාතීමේන්තුවේ දෙවන පෙළ ජේලර් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර තම අත් අකුරින්ම පුරවා 1960 මාර්තු 15 වන දිනට හෝ ඊට පෙර හෝ මෙම කායර්‍යාලයට ලැබෙන සේ " බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9 " යන ලිපිනයට එවිය යුතුයි.

ස.ල.—ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ " දෙවන පෙළ ජේලර් තනතුරු සඳහා ඉල්ලුම් කිරීම " යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණු වග දැනුම් දෙනු නො ලැබේ.

2. **වැටුප්.**—රු. 1,740න් පටන් ගෙන රු. 120සේ වාර්ෂික වැඩිවීම් 17 කින් රු. 3,780 දක්වා වැඩිවෙන වැටුපක් මෙම තනතුරට හිමිවේ. රු. 2,820 ට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි—**

පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ අරමුදලට දායක විය යුතුයි.

**4. සේවා කොන්දේසි—**

(අ) පත්වීම තුන් අවුරුද්දක පරීක්‍ෂාවට භාජන වේ.

(ආ) තෝරා පත් කරගත් අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම් විය යුතුයි.

(ඇ) තෝරාගත් අපේක්ෂකයා සියලුම දෙපාර්තමේන්තු විභාග වලින්, නියමිත කාලසීමාව තුළ දී සමත් විය යුතුයි. ඔහු දෙපාර්තමේන්තුවේ සෑම ආයතනයන් තුළම සේවය සඳහා පත් කිරීමට ඉඩ තිබෙන අතර, ඒ ඒ ආයතනයන් වල දී ඔහුට භාර කරන වැඩ කටයුතු ඉටු කළ යුතුයි.

(ඈ) පරීක්ෂා කාලය ඇතුළත, ඔහු තවදුරටත් සේවයෙහි රඳවා ගැනීමට නුසුදුසුයැයි මෙහි පහත අත්සන් කරන්නාට හැඟේ නම් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

**5. අවශ්‍ය සුදුසුකම්—**

(අ) ලාංකිකයෙකු වීම,

(ආ) 1960 මාර්තු 15 වන දිනට අවුරුදු 21ට නො අඩු හෝ අවුරුදු 30ට නො වැඩි විය යුතු බව,

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලබා ඇති බව,

(ඈ) මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුයි. අඩුම වශයෙන් උස අඩි 5, අඟල් 4 ක් ද, පපුවේ සාමාන්‍ය පළල අඟල් 32ක් ද විය යුතුයි.

(ඉ) සමාජ සේවා වැඩ පිළිබඳ පුහුණුවක් හෝ සුදුසුකම් ඇති අපේක්ෂකයින් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

6. ඉල්ලුම් කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් **සහතික පිටපත් පමණක්** අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය.

(ඇ) ළඟදී ලබාගත් චරිතය පිළිබඳ සහතික පත් 3 ක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරු වලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

8. මෙම නිවේදනයේ ප්‍රකාර නො වන සියලුම අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1960 පෙබරවාරි මස 25 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාරයේ මූලස්ථානයේ දීය.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජේලර් තනතුර සඳහා ඉල්ලුම් කිරීම

(**ස.ල.**—එවිය යුත්තේ සහතික වල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නො එවනවාත් හැර තැපෑලෙන් නැති වන සහතික ගැන දෙපාර්තමේන්තුව වග කියන්නේ ද නැත.)

1. සම්පූර්ණ නම :————.
   නම :————.
   වාසගම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. උපන් දිනය හා 60.3.15 වැනි දිනට වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

4. පියාගේ නම හා රක්ෂාව :————.

5. උපන් ස්ථානය :————.
   (අ) අයදුම්කරුගේ පියා :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයෙක් ද යන වග :————.
   (i) උත්පත්තියෙන් ද :————.
   (ii) නැත්නම් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද :————.

7. කසාද බැඳලා ද නැද්ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
   (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි)

9. ක්‍රීඩා පිළිබඳ ඇති තත්ත්වය සහ පළපුරුද්ද පිළිබඳව විස්තර හා ආරක්ෂක හමුදාවක හෝ ස්වේච්ඡා සේවක භට හමුදාවක හෝ සේවය කළේ නම් දිනයන් ද ඇතුලු එම සේවයෙහි විස්තර :————.
   (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි)

10. සමාජ සේවා පිළිබඳ සුදුසුකම් හා පළපුරුද්ද :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. දැනට රක්ෂාවක් තිබේ නම් එය :————.

12. චරිත සහතික දෙනු ලබන්නන්ගේ නම් හා ලිපිනයන් : ————.

13. පාසලින් අස්වූදා සිට කරන ලද රැකියාවන් :————.
   (ස්වාමියාගේ නම, සේවය හා සේවා කාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර සැපැයිය යුතුයි.)

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සිවිල් නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණය

සිවිල් සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ රජයේ අනෙක් නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්ෂණයක් 1960 අප්‍රේල් මස පහත පළවෙන දිනයන් හිදී පැවැත්වේ :—

| | | | |
|---|---|---|---|
| අප්‍රේල් 19 වැනි අඟහරුවාද | ... | නීතිය | සිවිල් සේවයේ සහ විදේශ සේවයේ යෙදී සිටින්නන් විසින් මේ දිනවල මෙම විෂයන් ගන්නවා ඇත. |
| අප්‍රේල් 20 වැනි බදාදා | ... | නීතිය | |
| අප්‍රේල් 21 වැනි බ්‍රහස්පතින්ද | ... | සිංහල, ලිඛිත* | |
| අප්‍රේල් 22 වැනි සිකුරාද | ... | දෙමළ, ලිඛිත | |
| අප්‍රේල් 23 වැනි සෙනසුරාද | ... | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති සහ පාලන රෙකුලාසි ; ගණන් තැබීම | |
| අප්‍රේල් 25 වැනි සඳුද | ... | නීතිය (අනෙක් නිලධාරීන් සඳහා) | |
| අප්‍රේල් 26 වැනි අඟහරුවාද | ... | සිංහල (වාචික) | |
| අප්‍රේල් 27 වැනි බදාදා | ... | දෙමළ (වාචික) | |

(* මේ කාල සටහන් වෙනස් කිරීමට ඉඩ තිබේ.)

වර්ෂ 1956යේ සැප්තැම්බර් මාසයේ 24 වැනි දිනයට පසු සිවිල් සේවයට බඳවා ගන්නා අය විසින් ගත යුතු ලංකා සිවිල් සේවා ව්‍යවස්ථාවේ 20 වැනි වගන්තිය යටතේ දක්වා ඇති, සිංහල ප්‍රශ්න පත්‍රය පහත දැක්වෙන කොටස් දෙකෙන් සමන්විත වේ :—

(1) භාෂාව සහ රචනය ... පැය 3 යි

(2) පරිවර්තනය ... පැය 3 යි

2. විදේශ සේවයේ ආධුනිකයන්, පොලිස් හමුදාවේ නිලධාරීන්, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කැලෑ දෙපාර්තමේන්තුව, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, රබර් කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව, ගුවන් සේවා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්, සහකාර ආහාර පාලක නිලධාරීන් (තාවකාලික), කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලක නිලධාරීන් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාලන සහකාර නිලධාරීන් සඳහා පැවැත්වෙන විභාගයන් ;

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව, වරාය ඉංජිනේරු තැනගේ දෙපාර්තමේන්තුව (කොළඹ වරාය කොමිෂම), විදුලි කටයුතු දෙපාර්තමේන්තුව, වෙළඳ දෙපාර්තමේන්තුව කර්මාන්ත දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුව, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා පැවැත් වෙන වාචික පරීක්ෂණයන් එකම දිනයකදී එකම ස්ථානයකදී පැවැත් වේ.

3. පහතින් දැක්වෙන අන්දමට, පුල්ස්කැප් පිටු බාගයක පිළියෙල කරගත් අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් එවිය යුතුය.

4. විභාගය පැවැත්වෙන්නේ විභාග කොමසාරිස් තුමන් යටතේ ය. එබැවින් විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති සහ රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් වෙනවා ඇත.

5. ඉල්ලුම්පත්‍ර, දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ගේ මාර්ගයෙන් කොළඹ 2, මැලේ විදියේ විභාග කොමසාරිස්තුමන් වෙත 1960 මාර්තු 21 වැනි දිනට පෙර රෙජිස්ටර් තැපැලෙන් යැවිය යුතුය.

ප්‍රමාද වී ලැබෙන කවර ඉල්ලුම් පත්‍රයක් වුවද ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ඇස්. ඇෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1960 පෙබරවාරි 16 වැනි දින,
මුදල් අමාත්‍යාංශය, කොළඹ.

## අයදුම් පත්‍රය

**ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව**

සිවිල් සේවය, විදේශ සේවය සහ රජයේ අනෙක් සේවයන්හි යෙදී සිටින (වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන් හැර) නිලධාරීන් සඳහා පැවැත්වෙන ත්‍රෛමාසික පරීක්‍ෂණය—ජනවාරි/අප්‍රේල්/ජූලි/ඔක්තෝබර්, 19—

(නොයෙදෙන වචන කපන්න)

කොළඹ 2, මැලේ විදියේ විභාග කොමසාරිස්තුමන් වෙත තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් රෙජිස්ටර් තැපැලෙන් යවනු සඳහා ය.

ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් කරන්න.

(1) පෙළෙපත් නම :————.
අනෙක් නම් :————.

(2) තනතුරු :————.
දෙපාර්තමේන්තුව :————.

(3) ලිපිනය (ප්‍රවේශ පත්‍රය එවනු සඳහාය) :————.

(4) ඔබ යෙදී සිටින්නේ සිවිල් සේවයේද, විදේශ සේවයේ ද, එසේ නැත්නම් ඔබ අයිති කවර දෙපාර්තමේන්තුවකටද? නො එසේ නම් ඔබ වාණිජ අයදුම්කරුවෙක් ද?

(5) විභාග දෙකකට පෙනී සිටිමට ඔබට සිදුවී ඇත්නම් මේ ඇතුළත් වන්නේ පළමු වැන්නටද දෙවැන්නටද?

(6) ඔබ ගන්නා විෂයයන් පැහැදිලි ලෙස සටහන් කරන්න. (ඔබ ගන්නේ ව්‍යවහාර භාෂාවද ලේඛන භාෂාවද නැත හොත් ඒ දෙකමද?) සිංහල හෝ දෙමළ විෂයයක් වශයෙන් ගන්නා සිවිල් නිලධාරීන් තමන් පෙනී සිටින්නේ පහළ පන්තියේ ප්‍රශ්න පත්‍රයටද, නැත්නම් උසස් පන්තියේ ප්‍රශ්න පත්‍රයට ද යන්න සඳහන් කළ යුතුය :—

1. ————.
2. ————.
3. ————.
4. ————.
5. ————.
6. ————.

(7) අයදුම්කරුගේ අත්සන සහ දිනය :————.

විභාග කොමසාරිස්තුමන් වෙත ය.

ඉහතින් දැක්වෙන අයදුම් පත්‍රය ඉදිරිපත් කරමි.

ඉහත සඳහන් කරන ලද තොරතුරු ඇතුළත් අපෙක්‍ෂකයා විභාගය සඳහා සුදුස්සකු බව, මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ අත්සන සහ තනතුර.

දිනය :————.

---

## සමුපකාර දෙපාර්තමේන්තුව

**සමුපකාර සමිතිවල කළමනාකරුවන් හෝ ලේකම්වරුන් වශයෙන් සේවය කිරීමට බලාපොරොත්තුවන අපෙක්ෂකයින් පුහුණු කිරීම**

ඉහත දැක්වෙන අභ්‍යාස පංක්තියට ඇතුල්වීම අපෙක්ෂාකරන අයදුම්කරුවන් විසින් ඒ සඳහා නියමිත ආකෘති පත්‍ර සමුපකාර විද්‍යාලයාධිපති තැනගෙන් හෝ අයදුම්කරු පදිංචි වී සිටින දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැනගෙන් හෝ, ලබාගෙන 1960 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස "සමුපකාර විද්‍යාලයාධිපති, සමුපකාර විද්‍යාලයය, පොල්ගොල්ල" යන ලිපිනයට එවන මෙන් ආරාධනය කරනු ලැබේ.

**අභ්‍යාස පංක්තිය පැවැත්වෙන කාල සීමාව.**—1960 මැයි 17 වැනි ද සිට 1960 අගෝස්තු 16 වැනිදා දක්වා.

**උගන්වන විෂය මාලාව.**—සමුපකාරය, පොත් තැබීම හා ගණන් තැබීම, ලේකම් පුහුණුව, විකුණුම් ශාස්ත්‍රය හා පරිපාලනය.

**අභ්‍යාස පංක්තියට ඇතුළත් කරගැනීමට අවශ්‍ය සුදුසුකම්.**—1960 මාර්තු 31 වැනි දිනට වයස අවුරුදු 18ට වැඩි වූද, අවුරුදු 40ට අඩු වූ ද, පහත දැක්වෙන අතිරේක සුදුසුකම් ඇත්තා වූ ද, ඕනෑම කෙනෙකුට මේ පංක්තියට ඇතුළත් වීමට ඉල්ලා සිටිය හැකිය.

**අතිරේක සුදුසුකම්.**—

(1) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමර්ථ්‍යය ලැබ සිටීම, හෝ;

(2) ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක කළමනාකරුවෙකු, ලේකම් කෙනෙකු, ගණන් තබන්නෙකු හෝ ගණන් තැබීමේ ලිපිකරුවෙකු වශයෙන් මාසික වේතනයක් ලබමින් අවුරුද්දක් හෝ එයට වැඩි කාලයක් තිස්සේ නො කඩවා සේවය කර තිබීම, හෝ;

(3) 1950 සිට 1957 දක්වා කාලය තුළ සමුපකාර විද්‍යාලයය මගින් පැවැත්වුණු සමුපකාර සේවකයින්ගේ සහතික පත්‍ර විභාග යෙන් සමර්ථ වී සිටීම, හෝ;

ව්‍යාප්ති අංශය මගින් සති අන්තයේ පවත්වන සේවක පුහුණුවීමේ පංක්ති අවසානයේ පරීක්‍ෂණ විභාගයෙන් "සමුපකාරය" හා "ගණන් තැබීම" යන විෂයයන්ගෙන් සමර්ථ වී සිටීම.

**අභ්‍යාස පංක්ති පැවැත්වෙන මධ්‍යස්ථාන.**—

(අ) පොල්ගොල්ල, මීගමුව, ගාල්ල, කුරුණෑගල, රත්නපුර, බණ්ඩාරවෙල, අනුරාධපුර සහ මඩකලපුව යන ප්‍රදේශයන්හි පිහිටුවා ඇති ප්‍රාදේශීය සමුපකාර මධ්‍යස්ථාන.

(එක මධ්‍යස්ථානයකට ඇතුල් කර ගන්නා වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාව 30කි. මේ මධ්‍යස්ථානවලට ඇතුල් වීම අපෙක්ෂා කරන අයදුම්කරුවන් එම පළාතේ පදිංචි හෝ සේවයේ යෙදී සිටින අය විය යුතු ය.

නේවාසික පහසුකම් සපයනු නො ලැබේ. මඩකලපුව හැර අනෙක් සියළුම මධ්‍යස්ථානයන්හි පංක්ති පැවැත්වෙන්නේ සිංහල භාෂාවෙන් පමණකි. මඩකලපුවේ පංක්ති පැවැත්වෙන්නේ දෙමළ භාෂාවෙනි.)

(ආ) මෙපමණක් නොව යාපනේ සමුපකාර මහා සංගමය විසින් යාපනේ සමුපකාර අභ්‍යාස පාඨශාලාවේදී ද, සමස්ත ලංකා සමුපකාර මහා සංගමය විසින්, කොළඹ, හලාවත, මාතර, කෑගල්ල, කළුතර හා මන්නාරම යන ස්ථානවලදී ද මෙබඳු පංක්ති පවත්වනු ලැබේ. එම පංක්තිවලට ඇතුළත්වීම අපෙක්ෂා කරන අයදුම්කරුවන් විසින් ඒ ඒ ආයතනයන් වෙත අයදුම් කළ යුත්තේ අයදුම්කරුවන් කැඳවන බැව් පුවත්පත් නිවේදනයකින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රසිද්ධ කිරීමෙන් පසුවය.

**පුහුණු වන්නවුන් තෝරා ගැනීම.**—පුහුණු වන්නවුන් තෝරා ගැනීම සඳහා එක් එක් මධ්‍යස්ථානයේදී ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එම නිසා ඉල්ලුම් පත්‍ර එවීමේදී ප්‍රවේශම් විය යුතුය. නියමිත සුදුසුකම් ඇති ආධුනිකයන් පමණක් ඉල්ලුම් පත්‍ර එවිය යුතුය. පරීක්ෂණ ගාස්තුව වශයෙන් රුපියල් 2ක පෝස්ටල් ඕඩරයක් "සමුපකාර මහා සංගමය, කොළඹ" නමට ගෙන තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතුයි. සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

**ගාස්තු.**—ඉගැන්වීම සඳහා කිසිම මුදලක් අය කරනු නොලැබේ. අභ්‍යාසය අවසානයේ පැවැත්වෙන විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් රුපියල් 2.50ක විභාග ගාස්තුවක් අය කරනු ලැබේ.

**විභාගය හා සහතික පත්‍රය.**—අභ්‍යාස කාලය අවසානයේදී පරීක්ෂණයක් පවත්වා ඉන් සමත් වූ අයදුම්කරුවන්ට "සමුපකාර සේවකයින්ගේ සහතික පත්‍රය" ප්‍රදානය කරනු ලැබේ.

**රක්ෂා ලැබීමේ අපෙක්ෂාව.**—මෙම සහතිකය ලැබූ අයට රැකී රක්ෂා සපයාදීමට සමුපකාර දෙපාර්තමේන්තුව බැඳී නැත.

පී. ඊ. වීරමන්,
වැඩ බලන සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**මහජන සෞඛ්‍ය පරීක්ෂකයන්ගේ පුහුණුකරවීමේ පන්තියට ආධුනිකයන් බඳවාගැනීම**

වර්ෂ 1959 දෙසැම්බර මස 11 වැනි දින අංක 12,002 දරන රජයේ ගැසට් පත්‍රයෙහි පළවූ 1959 දෙසැම්බර 7 වැනි දින දරන දන්වීම සම්බන්ධවයි. එහි සඳහන් අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 1960 මාර්තු 12 වැනි දින දක්වා දීර්ඝ කර තිබේ. 1959 දෙසැම්බර 7 වැනි දින දරන දන්වීම අනුව අයදුම් පත් ඉදිරිපත් කර ඇති අය නැවත ඉල්ලුම් පත් එවිය යුතු නොවේ.

විභාගය පැවැත්වෙන්නේ මුලින් සඳහන් කළ පරිදි 1960 මාර්තු 5 වැනි දින දී නොව 1960 අප්‍රියෙල් 2 වැනි දින බැව් සළකන්න.

පී. රාජසිංහම්,
නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
(මහජන සෞඛ්‍ය සේවා)

1960 මාර්තු 1 වැනි ද,
කොළඹ දී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජකීය ලංකා ගුවන් හමුදාව

**ගගනයාත්‍රාංගණ වේදිකාවේ වැඩ**

හතරැස් අඩි 14,000 පමණ කොටසක මතු පිට වැලි මිශ්‍ර බිටියුමන් දැමීම ද, හතරැස් අඩි 1,700 පමණ කොටසක මතු පිට බිටියුමන් ගල් තාර දැමීම ද කොන්ක්‍රීට් දමා තිබෙන වේදිකාවේ අඩි 23,000ක් පමණ වූ කුස්තුර ශුද්ධ කොට නැවත බිටියුමන් පිරවීම ද සඳහා, 1960 මාර්තු මස 23 වැනි බදාදා පෙ. ව. 9.30 දක්වා කොළඹ, සැනේට් සභා ගොඩනැගිල්ලේ රාජ්‍ය ආරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර පත්‍ර භාර ගනු ලැබේ.

කොළඹ, ජාර්සන් පාරේ ගුවන් හමුදා මූලස්ථානයේ ප්‍රධාන වැඩ නිලධාරියා වෙත ඉල්ලුම් පතක් යවා, ඔහුගෙන් ටෙන්ඩර් කොන්දේසි මාලාවේ පිටපතක් ලබා ගත හැකිය.

ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිකුත් කරනු ලැබීමට කලින්, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 200ක්, කොළඹ, පාර්සන්ස් පාරේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලන නිලධාරියා වෙත තැන්පත් කළ යුතු ය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කිලිනොච්චියේ ගොවිපොළේ අළුත් කුඹුරු ඉඩම්වල වේලිදැමීම ආදිය**

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, පහත සඳහන් කාරණා සඳහා ටෙන්ඩර් පත්‍ර, 1960 මාර්තු මස 25 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

කිලිනොච්චි ගොවිපොළේ අළුත් කුඹුරු ඉඩම් අක්කර 50 හේ වේලි දැමීම හා මට්ටම් කිරීම. 1960 සැප්තැම්බර් මස 30 වැනි දිනට පෙර මෙම කාර්‍ය්‍යය අවසන් කළ යුතුය.

2. යාපනයේ කෘෂිකර්ම කාර්‍ය්‍යාලයේ දිස්ත්‍රික් කෘෂි ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව, ලියුම් කවරයක බහා, සීල් තබා, "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "කිලිනොච්චි ගොවිපොළේ වේළිදැමීම හා කුඹුරු මට්ටම් කිරීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. 1960 මාර්තු 23 වැනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නො හැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ටද ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් ලිපිකරු නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "කිලිනොච්චි ගොවිපොළේ වේලි දැමීම හා කුඹුරු මට්ටම් කිරීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නො ලැබුනොත් ඔහු පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියානැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තින්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහු ගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්‍ය්‍යය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. වර්ෂ 1934රේ, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥා පණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැදෙනු නො ලැබේ.

17. වැඩි විස්තර යාපනේ, කෘෂිකර්ම කාර්‍ය්‍යාලයේදී කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

වර්ෂ 1960 පෙබරවාරි මස 22 වැනිද,
පේරාදෙණියේ දීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වීරපාන ගොවිපොළට නා කදන් සැපයීම

මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැන විසින් වීරපාන රජයේ ගොවිපොළට අඩි 60 ක් දිග, මුල අඩි 6 ක් හා අග අඩි 3½ ක වට ප්‍රමාණය ඇති නා කදන් තුනක් සැපයීමට සහ ගෙන ගොස් භාරදීමට ටෙන්ඩර් පත්‍ර 1960 මාර්තු මස 25 වැනි දින ප. ව. 2.30 වන තෙක් භාර ගනු ලැබේ.

2. පෝර්ම කොළ මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් ලබා ගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් ද සහිතව ලියුම් කවරයක බහා සීල් තබා " දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, මාතර " යන්න ලියා එහිම මුදුන් වම් කොනේ " වීරපානට නාකදන් " සැපයීමේ ටෙන්ඩරය, යන්න ලියා, මාතර කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැන වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම, කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවුවහොත් ටෙන්ඩර් කරුවන් හෝ හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මාතර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. රිජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුනු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙක් විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුළත නොලැබුනේ නම් ඒ ගැන මාතර කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ඉහත කියන ලද ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත දිනයේ එකී වේලාවේදී මාතර කෘෂිකර්ම කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති හෝ කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද දේවල් මුළු වියදමෙන් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමෙන් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්ම ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

12. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. " ලාංකිකයා " යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සපයන ලද ලිපිනයට තැපැලෙන් යැවුවොත් හෝ ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

14. 1934 රේ 19 අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධත්වය පළකරන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ත හා නිෂ්පාදන නිලධාරි තැනගෙන් දැන ගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 පෙබරවාරි මස 22 දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අනුරාධපුරයේ රජයේ ගොවිපලේ ඇති කොට්ට පුළුන් ගෙඩි විකිණීම

අනුරාධපුරයේ රජයේ ගොවිපලේ ඇති කොට්ට පුළුන් ගෙඩි මිලදී ගැනීම සඳහා අනුරාධපුරයේ දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන විසින් 1960 මාර්තු 25 වැනිදා වන තෙක් මිල ගණන් බාරගනු ලැබේ.

මිල ගණන් සඳහන් කිරීමේදී ගෝනි රහිතව හොණ්ඩරයක මිල සඳහන් කළයුතුය. එසේ මිල ගණන් සඳහන් ඉල්ලීම් අනුරාධපුරයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නැතහොත් මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නා විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ පුද්ගලිකවම භාර දිය යුතුය. මේ දෙයාකාරයෙන්ම එවන ඉල්ලීම් බහාලන ලද ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " කොට්ට පුළුන් සඳහා මිල ගණන් " යනුවෙන් සඳහන් කළයුතුයි.

මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නෙකුට ඔහු කැමති නම් කාර්යාලවල වැඩකරණ වේලාව ඇතුළත ඕනෑම දිනයකදී අනුරාධපුරයේ රජයේ ගොවිපලේදී මේවා බැලිය හැකිය.

තමාගේ මිල ගණන් භාරගන්නා ලද වග දන්වා දින 10 ක් ඇතුළත මිලදී ගන්නා තැනැත්තා විසින් ද්‍රව්‍යවල වටිනාකම අනුරාධපුරයේ රජයේ ගොවිපල භාර නිලධාරි තැන වෙත තැන්පත් කර බඩු තොගය සම්පූර්ණයෙන්ම ගෙන යා යුතුය.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960. 2. 22 දා, පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොළොන්නරුවේ ගොවිපලේ දුම්කොළ උදුන් " බාන්ස් " දෙකක් සෑදීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පොළොන්නරුවේ ගොවිපලේ දුම්කොළ උදුන් " බාන්ස් " දෙකක් (2) සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 මාර්තු මස 25 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. පොළොන්නරුවේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන අනු පිටපතක්ද සහිතව ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා " පොළොන්නරුවේ ගොවිපලේ දුම්කොළ උදුන් (බාන්ස්) සෑදීම සඳහා ටෙන්ඩර් " යන්න එම ලියුම් කවරයේ වම් පැත්තේ මුදුනේ ලියා පේරාදෙණියේ ගොවිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත යැවිය යුතුයි.

3. 1960 මාර්තු මස 25 වැනි දින දවල් 12 වන තෙක් කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ රු. 25 තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ

පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි උවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලැයිස්තුවටද ඇතුලත් වන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔහුගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් කටයුතු භාර ලිපිකරුවාට ඒවා අතින්ම භාරදිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "පොලොන්නරුවේ ගොවිපලේ දුම්කොළ උදුන් (බාන්ස්) සෑදීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරණ දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් (4) ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනාවීනම් ටෙන්ඩර් විවෘත කරණ වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී ඒවා විවෘත කරණු ලැබේ.

6. නියමිත ෆෝර්මයෙහි ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

8. ටෙන්ඩර්කරුවන් පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්‍යාලයේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් මේ ගොඩනැගිලි සම්බන්ධව ප්ලෑන, දිග පළල යනාදී වැඩි විස්තර ලබා ගත යුතුයි. සෑම ටෙන්ඩර්කරුවෙක්ම මේ ගොඩනැගිලි සෑදීමට අදහස් කරණ ස්ථාන පරීක්ෂාකර බලා ටෙන්ඩර් පත්‍ර යැවුවහොත් යෙහෙකි.

9. මේ දුම්කොළ උදුන් (බාන්ස්) දෙක සාදා නිමකර ඒවා 1960 ජූනි මස 25 වැනි දිනට පෙර භාරදිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන්වූ ද පිළිගනු ලැබුවාවූ ද දේවල මුලු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරණු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ නම් මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇපය රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

11. ටෙන්ඩර් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසිනු ගෙවිය යුතුයි.

12. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන සේ ස්ථිර ඒවා විය යුතුයි.

13. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන තබාගනු ලැබේ.

14. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

15. කොන්ත්‍රාත්කරුවාට භාරදීය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා සේ සලකනු ලැබේ.

16. 1934, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

17. වැඩ කිරීමට නුසුදුසු යයි කල්පනා කරණු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුට වැඩට ගැනීම ගැන විරුද්දවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

18. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත්වූ හෝ තමාට සෑහේ යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

19. වැඩි විස්තර පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් හෝ ගොවිපලේ කළමනාකාර තැනගෙන් හෝ දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන.

1960 පෙබරවාරි මස 22 වැනි දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යාපනේ දිස්ත්‍රික්කයේ ගොවිපොළවලට පොල් අතු සැපයීම

පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, පහත සඳහන් ස්ථානවලට පොල් අතු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, 1960 මාර්තු මස 25 වෙනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ:—

යාපනේ ගොවි පාසැලට 7,500 යි.

පරන්තන් ගොවිපොළට 7,000 යි.

කිලිනොච්චි 5,000 යි.

යාපනේ කාන්තා ගොවි පාසැලට 4,000 යි.

චංකානේ පට්ටි මධ්‍යස්ථානයට 1,200 යි.

පංඩතෙරෙප්පු මධ්‍යස්ථානයට 400 යි.

උඩුවිල් පට්ටි මධ්‍යස්ථානයට 1,000 යි.

අච්චුවේලි "ලැගුන්" යෝජනා ක්‍රමය 1,500 යි.

අවශ්‍ය වුවහොත් තවත් පොල් අතු 25,000ක් එම මිල ගණන් වලට සැපයිය යුතුය.

2. යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂි ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව, ලියුම් කවරයක බහා, සීල් තබා, "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "යාපනේ දිස්ත්‍රික් ගොවිපොළවලට පොල් අතු සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නො හැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ටද ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් ලිපිකරු නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "යාපනේ දි. ගොවිපළවලට පොල් අතු සැප්යීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නො ලැබුනොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්කොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. වර්ෂ 1934රේ, 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

17. වැඩි විස්තර යාපනේ, කෘෂිකර්ම කාර්යාලයේ දී, කෘෂි ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ගොවිපොළේ කළමනාකාර තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

වර්ෂ 1960 පෙබරවාරි මස 22 වැනි දින,
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යාපනය දිස්ත්‍රික්කයේ ගොවිපළවලට පිදුරු සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 මාර්තු මස 25 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

මෙම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි දැන්වීමේ සඳහන් ස්ථානයන්ට හොඳ වගීයේ නොතෙමුණු පිදුරු සැපයීම හා ගෙනගොස් බාරදීම.

2. යාපනයේ කෘෂිකර්ම නිෂ්පාදන ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල්තබා "සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "යාපන දිස්ත්‍රික්කයේ ගොවි පළවලට පිදුරු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව කටයුතු කරණ ලිපිකරු තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "යාපන දිස්ත්‍රික්කයේ ගොවිපළවලට පිදුරු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපැලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුලත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු නොලැබේ.

පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුලත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකණු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසිපරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂවෙත තබා ගනී.

11. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

12. 1934රේ 19 වෙනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත් කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේයයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර යාපනයේ කෘෂිකර්ම නිෂ්පාදන ව්‍යාප්ත කිරීමේ නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 පෙබරවාරි 22 දී,
පේරාදෙණියේ දීය.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

කොළඹ ගබඩා අංශයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්. (1959-60 ආදායම් වර්ෂයේ ද්විතීය භාගය සඳහා)

කොළඹ ගබඩා අංශයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් පහත සඳහන් ව්‍යාපාරයන්ට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960ක් වූ මාර්තු මස 12 වෙනි දින දවල් 12 දක්වා බාරගනු ලැබේ :—

(අ) මඩලගම.
(ආ) දෙල්ගොඩ.
(ඇ) කරවිට.
(ඈ) එරත්න..
(ඉ) ප්‍රධාන කාර්යාලය, කොළඹ.

(1) පිලිස්සූ ගඩොල්—(වැඩපොලට සැතපුමකට වඩා දුර නොවිය යුතුයි. වැඩපොලටම සැපයිය යුතුයි.)

(2) කළු ගල් 6"×9"— (එම)

(3) අළු හුණු—(දුම්රිය ගාස්තු රහිතව සැපයීම. දුම්රියෙන් සපයනවා නම්, ළඟම ඇති දුම්රිය ස්ථානය හෝ දෙපාර්තමේන්තුවේ ලොරිවලින් ගෙන යා හැකි ළඟම ස්ථානය සඳහන් කළ යුතුයි. එසේ නැතිනම් වැඩ පොලට ගෙන ආයුතුයි.)

(4) තම්බාපු හුණු— (එම)

(5) පොල් අතු—(දිග අඩි 7ටත් පළල අඩි 1½ටත් අඩු නොවිය යුතුයි. ටොන් 2කට වඩා බරැති ලොරිවලට, ගම්සභා හා ප්‍රාදේශීය මාගී කොමිටියේ පාරවල්වල ගමන් නොකළ හැකි නිසා දෙපාර්තමේන්තුව සතු ලොරි වලින් සැපයීම කළ යුතුය.)

(6) තලාපු කළු ගල්—(¼", ½", ¾", 1" සහ 2"—වැඩපොලට සැතපුම කට වඩා දුර නොවිය යුතුයි. වැඩපොලටම සැපයිය යුතුයි.)

2. 1960 මාර්තු 9 වෙනි දින දවල් 12 දක්වා කිරුලපනේ ගබඩා අංශයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් පත්‍රිකා ලියා අනුපිටපතකුත් සහිතව ඉදිරිපත් කළ යුතුයි. ඉහත කී ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කාර්යාලයෙන් හෝ කච්චේරියෙන් රු. 50ක ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය. ඒ ඒ ව්‍යාපාරයට වෙන වෙනම ඇප මුදල් තැබිය යුතුය.

3. 1960 මාර්තු 14 වෙනි දින දවල් 12ට ඉහත සඳහන් ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර්කරුවන්ට මේ අවස්ථාවේදී පැමිණ සිටිය හැකිය.

4. මේ සඳහා වැඩි විස්තර කිරුලපනේ ගබඩා අංශයේ ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. ජී. සී. සී. පතිරත්න,
ඉඩම් සංවර්ධන නිලධාරි (ගබඩා).

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
කිරුලපන, 23. 12. 60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර මධ්‍යම දිශාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් පහත සඳහන් වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටැන්ඩර් 1960 මාර්තු මස 30 බදාදා පෙරවරු 10ය වන තෙක් භාරගනු ලැබේ :—

| වැඩ විස්තර | ලියාපදිංචි විය යුතු ගණන | තැන්පත් කළ යුතු මුදල |
|---|---|---|
| වැගොල්ලවැව අලුත් වැඩියා කිරීම සඳහා | රුපියල් 38,000 හෝ ඊට වැඩියෙන් | රුපියල් 50 |

තැන්පත් කළයුතු මුදල නාලන්ද වාරිමාර්ග කාර්යාලයෙහි හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට රිසීට් පතක් ඉදිරිපත් කිරීමෙන් 1960 මාර්තු 5 දින සිට 1960 මාර්තු 29 දින දක්වා ටැන්ඩර් පත්‍ර නාලන්ද වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් වැඩ භාරගෙන සිටින කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ වැඩවල තත්ත්වය පිළිබඳ සහතිකයක් එම වැඩ භාර නිලධාරි තැනගෙන් ඉදිරිපත් කළ යුතුයි.

මහනුවර මධ්‍යම දිශාවේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 මාර්තු මස 30 වන බදාදා පෙරවරු 10.30 ට ටැන්ඩර් විවෘත කරන වේලාවට යම් කිසි කොන්ත්‍රාත් කරුවෙකුට උවමනා නම් එහි පෙනී සිටිය හැක.

උප කොට්ඨාශ භාර නිලධාරි තැන,
නාලන්ද.

වාරි මාර්ග කාර්යාල ය,
නාලන්ද—1960.2.16.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වවුනියාවේ උතුරු දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මන්නාරම් උප වාරිමාර්ග කොට්ඨාශයේ පනම්කාමම් ආගුමෙන්ටේෂන් ව්‍යාපාරය අළුත් වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් 1960 වේ මාර්තු මස 22 වෙනි දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

2. මන්නාරමේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර්, ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. වැඩ පිළිබඳ විස්තර මන්නාරමේ ඉංජිනේරු තුමාගෙන් දැනගත හැක. ප්ලෑන් ඔහුගේම කාර්යාලයේදීම බලාගත හැක.

3. ඕනෑම කච්චේරියක හෝ මුරුන්කනේ වාරිමාර්ග කාර්යාලයේ හෝ රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග තමා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පු කරවන අයවලුන්ට පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

රු. 40,000 ට සහ ඊට ඉහළ ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර්වලට සුදුස්සෝ වෙති.

වාරිමාර්ග ඉංජිනේරු තැන.
උප කොට්ඨාශය මන්නාරම.

මුරුන්කන්
12.2.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වවුනියාවේ උතුරු දිශාව භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තුමා විසින් මන්නාරම් උප වාරිමාර්ග කොට්ඨාශයේ ආයම් පෙරුමාල් වැව අලුත් වැඩියා කරවීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 වේ මාර්තු මස 22 වෙනි දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

2. මන්නාරමේ ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවලට බහා ඉදිරිපත් කළ යුතුයි. වැඩ පිළිවෙල සඳහා විස්තර මන්නාරමේ ඉංජිනේරු තුමාගෙන් දැනගත හැක. ප්ලෑන් ඔහුගේම කාර්යාලයේදී බලා ගත හැක.

3. ඕනෑම කච්චේරියක හෝ මුරුන්කනේ වාරිමාර්ග කාර්යාලයේ හෝ රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග තමා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පු කරවන අයවලුන්ට පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රු. 30,000 ට සහ ඊට ඉහල ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් වලට සුදුස්සෝ වෙති.

වාරිමාර්ග ඉංජිනේරු තැන.
උප කොට්ඨාශය මන්නාරම.

මුරුන්කන්
12.2.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—බටහිර කොට්ඨාශය

කොළඹ 8, කෝට්ටේ පාරේ බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් (1) පණුගල අමුණ යෝජනා ක්‍රම යේ මාඹිට ප්‍රමාණකය (Regulator) තැනීම හා (2) මගුරුවල් පිටිය අමුණ සංවර්ධනය කිරීම සඳහා පිළිවෙලින් මෙම දෙපාර්තමේන්තුවේ රු. 25,000 හා රු. 15,000 හෝ ඊට වැඩි ප්‍රමාණවලට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960, මාර්තු මස 31 වන බ්‍රහස්පතින්ද පෙරවරු 11.30 දක්වා වෙන වෙනම මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් භාර ගන්නවා ඇත.

මේ පිළිබඳ වැඩි විස්තර, සැලැස්ම හා ටෙන්ඩර් පෝර්ම පත්‍ර අත්තනගළු ඔය යෝජනා ක්‍රමයේ උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි තැනගෙන් ලබා ගත හැක. ටෙන්ඩර් පත් එවිය යුත්තේ අනු පිට පතක් ද සමගය.

ටෙන්ඩර් පත් 1960 මාර්තු මස 8 වන දින සිට 1960 මාර්තු මස 28 වන දින දක්වා කාර්යාලයන්හි රජකාරි කරන වේලාවන් අතරදී ලබාගත හැක. ඒ සඳහා ඕනෑම කච්චේරියක හෝ මෙහි පහත සඳහන් කාර්යාලයෙහි රු. 25ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් තම සුදුසුකම් සමග ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රශ්න රහිතව ප්‍රතික්ෂෙප කිරීමේත් ඕනෑම ටෙන්ඩර් පතක ඕනෑම කොටසක් පිළිගැනීමේත් බලය රජය සතුවේ.

ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කළ අයට කැමතිනම් පැමිණ සිටිය හැක.

පී. එල්. එම්. බාලදාස,
උප ප්‍රාදේශීය වාරිමාර්ග නිලධාරි,
අත්තනගළු ඔය යෝජනා ක්‍රමය.

වාරිමාර්ග කාර්යාලය,
ගම්පහ, 18. 2. 60

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මොනරාගල උප කොට්ඨාශයේ ඇටිමෝල වැව් කණ්ඩියේ කැඩුණු තැන් පිරවීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ 355 වැනි කාමරයෙහි වූ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1) 1960 අප්‍රේල් මස 26 වැනිදා (අඟහරුවාදා) පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග හෝ දුම්රිය හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 90,000කට නො අඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ඉල්ලුම් කළ හැක.

බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250ක් ඕනෑම කච්චේරියක බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 අප්‍රේල් මස 22 වැනිදා (සිකුරාදා) දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල යෙන් ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂ තැන වෙනුවට.

කොළඹ, 1959.10.12.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ දක්ෂිණ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960. 4. 5 දින පෙරවරු 10 දක්වා ඇඹිලිපිටියේ හුලංදූ ඔය ව්‍යාපාරයේ ට්‍රැක්ට් ඉදිකිරීම පිණිස ඒ. බී. සී. සහ ඩී යන අංශ යටතේ පහත සඳහන් වැඩ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මෙහි පහත ලේඛනයෙහි සඳහන් ගණන්වලට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

අංශ ඒ-ඩී නොම්මර 1 සහ 2 යන ඇලවල්
ලියාපදිංචිවූ ගණන රු. 17,000 සහ ඊට වැඩි.

අංශ බී-ඩී නොම්මර 3 ඇල
ලියාපදිංචිවූ ගණන රු. 37,000 සහ ඊට වැඩි.

අංශ සී-ඩී නොම්මර 4 ඇල
ලියාපදිංචිවූ ගණන රු. 15,000 සහ ඊට වැඩි.

අංශ ඩී-ඩී නොම්මර 5 ඇල
ලියාපදිංචිවූ ගණන රු. 11,000 සහ ඊට වැඩි.

2. ඇඹිලිපිටියේ උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝර්මවල එක වැඩයකට ටෙන්ඩර් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුයි.

3. 1960. 3. 29 සිට 1960. 3. 31 වැනි දින දක්වා කාර්යාල වේලාවල් තුළදී (දෙදිනම ඇතුළුව) ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා අංශ ඒ. සී. සහ ඩී යන අංශවල වැඩ සඳහා එකකට රුපියල් 25 ගණනේද "බී" අංශයේ වැඩ සඳහා රුපියල් 50ක්ද ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිද, ලියාපදිංචි කරන ලද පොත්ද ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

ඇම්. ජේ. ඇෆ්. ආර්. සේනාරත්න,
ඇඹිලිපිටිය උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
ඇඹිලිපිටිය; 20/24.2.1960.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් බදුලු ඔය ව්‍යාපාරයේ 6 වැනි සැතපුමේ ගංවතුරින් අලාභ වූ කොටස් අළුත් වැඩියා කිරීම සඳහා සීල් තබනලද ටෙන්ඩර්පත් 1960 මාර්තු 30 වැනි බදාදා උදය 10 වනතෙක් මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් පත්‍ර භාරගනුලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් සමන්විත විය යුතුය. අවශ්‍ය පෝම් ආදිය බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර ඒ සඳහා ඇති සැලසුම් සහ අනෙකුත් විස්තර ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂාකළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්තුකරුවන් බව ඔප්පුකළ හැකි හා රුපියල් 25 කච්චේරියක හෝ බදුල්ල වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත්කළ අයවළුන්ට පමණක් 1960 මාර්තු 28 වැනි දින තෙක් ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

ඇ. ජේ. ප්‍රි. පොන්රාජා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
බදුල්ල උප කොට්ඨාශය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තිස්සමහරාම උප කොට්ඨාශයේ ඇල්ලගල ඕවර්සියර් නිවාසයක් තැනීම සඳහා තංගල්ලේ දකුණු කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 අප්‍රියෙල් මස 5 වෙනි දින පෙරවරු 10 දක්වා රු. 20,000කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

තිස්ස උප කොට්ඨාශ භාර වාරිමාර්ග නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම අනුපිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුයි.

වාරිමාර්ග අධ්‍යක්ෂක තුමා නමින් රුපියල් 25 තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිත්තාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 28.3.60 දින සිට 1.4.60 දින දක්වා තිස්ස උප කොට්ඨාශයේ වාරිමාර්ග කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. මේ ගැන වැඩි දුර විස්තර තිස්ස මහරාම උපකොට්ඨාශයේ වාරිමාර්ග නිලධාරිතැනගෙන් ලබාගත හැක.

අයි. ද ලීමා,
උ. ප්‍රා. වා. නි. තැන.

වාරිමාර්ග කාර්යාලය,
තිස්සමහරාමය. 22.6.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් බත්මැඩිල්ල දෙවෙනි අවදියේ වක්කඩවල් වැඩි දියුණු කිරීම හා අළුත් වැඩියා කිරීම සඳහා සීල්තබන ලද ටෙන්ඩර් පත් 1960 මාර්තු 30 වැනි බදාදා උදය 10තෙක් මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 14,000 හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් සමන්විත විය යුතුය. අවශ්‍ය පෝර්ම ආදිය බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර ඒ සඳහා ඇති සැලසුම් සහ අනිකුත් විස්තර ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පු කළ හැකි හා රුපියල් 25 කච්චේරියක හෝ බදුල්ල වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ අයවළුන්ට පමණක් 1960 මාර්තු 28 දින තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ.

ඇ. ජේ. ප්‍රි. පොන්රාජා,
බදුල්ල වාරිමාර්ග ඉංජිනේරු.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—බටහිර කොට්ඨාශය

කොළඹ 8, කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් 1960 මාර්තු මස 25වෙනි දින දවල් 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ ඉත්තැපාන කරදිය වැලක්වීමේ ව්‍යාපාරයේ කම්කරු පුට්වු නිවාසයක් තැනීම සඳහා රු. 12,000කට හෝ ඊට වැඩි ගණනකට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් සීල් තබනලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කළුතර වාරි මාර්ග ඉංජිනේරු තැන විසින් 1960 මාර්තු මස 22වෙනි දින දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී රු. 25ක ටැන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතක් හෝ වාරි මාර්ග අධ්‍යක්ෂක තුමා නමට ගත් රු. 25ක මුදල් ඇණවුමක් ඉදිරිපත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක කොටසක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීම රජය සතුය.

වැඩි විස්තර කළුතර වාරි මාර්ග ඉංජිනේරු තැනගෙන් විමසන්න.

ඊ., රණසිංහ,
වාරි මාර්ග ඉංජිනේරු තැන,
කළුතර උපකොට්ඨාශය.

වාරි මාර්ග කායසීලය, කළුතර,
1960.2.16.

---

## සුලු වාරිමාර්ග වැඩ

පහත සඳහන් සුලු වාරිමාර්ග වැඩ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමා, විසින් 1960 මාර්තු 15වන අඟහරුවාද අ. භා. 2.30 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ :—

**හාපිටිගම් කෝරළේ—**

(1) වේවැල්දෙනියේ රදුතොටුපල ජලදොර තැනීම.

(2) පනාවල පිටවල කුඹුරේ ජලගෙදර තැනීම.

(3) බෝතලේ ඉහළගම ඇලවල් තුනක් සුඩකිරීම.

**බටහිර සියනෑකෝරළේ (අධිකාරී පත්තුව)**

1. බියගම ගල්වාන අමුණ බැඳීම.

**නැගෙනහිර සියනෑකෝරළේ—**

(1) පද්දුවෙල වෙදගෙ අමුණ බැඳීම.

(2) වතුපිටිවල විලිකුඹුර අමුණ බැඳීම.

(3) හක්ගල්ලේ කන්මැන්දුව කුඹුර තැනීම.

**උතුරු අළුත්කුරු කෝරළේ "බී" කොටස**

1. බුරලපිටියේ බෝගහවෙල මැද ඇල හරහා ජලදොරක් තැනීම.

**බටහිර සියනෑකෝරළේ මැද පත්තුව—**

(1) කිරිකිත්ත ප්‍රදේශයේ ඇලවල් තුනක් අළුත්වැඩියා කිරීම.

(2) උතුවන්බෝගහවත්ත ප්‍රදේශයේ ඇලවල් අළුත්වැඩියා කිරීම.

(3) දඩගමුවේ පත්ගම වැවේ ජලදොර සහ බෝක්කුව පළල් කිරීම.

**දකුණු අළුත්කුරු කෝරළේ—**

(1) හැඳල හෙප්‍රුවල දෙපාඇල සුඩකිරීම.

(2) පැලියගොඩ වෙලේ දෙපාඇල සුඩකිරීම.

(3) කිරිඳිවිට කොටගෙදර දෙපාඇල සුඩකිරීම.

(4) බටුවත්ත, වල්පොල සහ මැද්දගොඩ ඇලවල් තුනක් සුඩකිරීම.

**හේවාගම් කෝරළය—**

(1) කලුඅග්ගල ඇලවල් සුඩකිරීම.

(2) පනාලුව ඇලවල් සුඩකිරීම.

(3) කොස්ගම ඉහළ පැලිය කුඹුරේ අමුණක් තැනීම.

**සල්පිටි කෝරළේ—**

(1) බෝකුන්දර මහා ඇල සහ බෝකුන්දර පුංචි බෝක්කුවෑ ඇල අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් වැඩ 1960වේ පෙබරවාරි 19 වන දින රජයේ ගැසට් පත්‍රයේ මවිසින් පළකරනු ලැබූ ටෙන්ඩර් දැන්වීමේ සඳහන් වැඩ 23කට අමතර වශයෙන්ය.

එක් එක් ටෙන්ඩර් පත්‍රිකාවක් සඳහා රුපියල් 25ක් බැගින් කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමා සමග තැන්පත් කොට රිසිට් පත් ලබාගත යුතුයි. ටෙන්ඩර් පෝර්ම කොළ 1960 මාර්තු 14 වන දින අපරභාග 2.30 දක්වා මෙම කායසීලයෙන් ඉහත සඳහන් රිසිට් ඉදිරිපත් කොට ලබාගත හැක.

මේ සඳහා වැඩි විස්තර මෙම කායසීලයෙන් දැනගත හැකිය.

ජී. ඇල්. ඩී. පී. සේනාරත්න,
සහකාර ගොවිජන සේවා කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

1960.2.29 වෙනි දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
නො. 283, ගාලුපාර, කොල්ලුපිටිය,
කොළඹ 3.

## වන සංරක්ෂක දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ කෘෂිකම් සහ ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බුස්සේ පිහිටි "ඉම්ප්‍රෑග්නේෂන් ප්ලාන්ට්" එකට "කෝල්ටාර් ක්‍රියෝසෝට් —බී. ඇස්. ඇස්. 144" ගැලුම් 40,000 සැපයීම සඳහා වර්ෂ 1960 ක්වූ අප්‍රේල් මස 19 වෙනි දින පෙරවරු 10 වන තුරු ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ කිව් රෝඩ්හි පිහිටි වන සංරක්ෂක තැනගේ කාර්යාලයෙන් තැන්පත් මුදලක් වශයෙන් රු. 125 ක් ගෙවා ටැන්ඩර් පෝර්ම කොළ ලබාගෙන අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. ටැන්ඩර් පෝර්ම කොළ වර්ෂ 1960 ක්වූ අප්‍රේල් මස 18 වෙනි දින වනතුරු නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ කිව් රෝඩ්හි පිහිටි වන සංරක්ෂක තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක තැන.

කොළඹ 2.
1960 පෙබරවාරි 26 දිය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1960 මාර්තු මස 25 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් කොළඹ අධ්‍යාපන දෙපාර්ත මේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| (1) කෑ/රුවන්වැල්ල මධ්‍ය මහා විද්‍යාලය | ... | ක්‍රීඩා පිට්ටනියේ ඉතිරි වැඩ අව සන් කිරීම. |
| (2) කෑ/නිල්වක්ක විද්‍යාලය | ... | ගොඩනැගිල්ලක් තැනීම |

සංලක්ෂ්‍යය.—කෑ = කෑගල්ල දිස්ත්‍රික්කය.

2. මේ වැඩ සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ රු. 22,000 හෝ ඊට වැඩිවූද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 11,000 ක් හෝ ඊට වැඩිවූද, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට කොළඹ අධ්‍යාපන කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් සබරගමු පළාතේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කර 1960 මාර්තු මස 24 වන දින මධ්‍යාහ්නය වන තෙක් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. චෙක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් භාර ගනු නොලැබේ. යටකී කුවිතාන්සි තැපෑලෙන් එවන්නේ නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

ලියා පදිංචිවූ සමූපකාර සමිති ග්‍රාම සංවර්ධන සමිති හෝ කම්කරු සමූපකාර සමිති වලටද පිළිවෙලින් සමූපකාර රිජිස්ට්‍රාර්තුමා, ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂකතුමා, හෝ කම්කරු කොමසාරිස් තුමා වෙතින් රු. 22,000ක නොඅඩු වැඩ කිරීමේ ශක්තියක් ඇති බවට ලබාගත් සහතිකයක් අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර් පත් 1960 මාර්තු මස 24 වැනි දින මධ්‍යාහ්නය වන තෙක් ලබාගත හැක.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීම් බලපත්‍ර කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඇස්. ඩබ්ලිව්. ශාඛාවෙන් හෝ රත්නපුර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත යුතුය. මුදල් ගෙවීම් පත්‍ර නිකුත් කරණු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන් කළ මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

4. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් පරිදි අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් එවිය යුත්තේ අනු පිටපතක් සහිතවය. සියලුම විස්තර හා තොරතුරු රත්නපුර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2" යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් සිය ටෙන්ඩර් පත් රිජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය.

5. 1960 මාර්තු මස 25 වැනි දින පස්වරු 2.30ට කොළඹ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. තවද, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද රේට් ගණන් ටෙන්ඩර්කරුවන්ගේ නම්ද කියවනු ලැබේ.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් භාර ගැනීම අවසාන කර සති 6කට නොඅඩු කාලයක් තුළ සහතික ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර සබරගමු පළාතේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද එහිදී පරීක්ෂා කළ හැකිය.

8. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදවිය යුත්තේ පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩ කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකි තාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම් කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම බඳවාගත් කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් වේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම් කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් කඩ කිරීම සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද හේතු වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මතිය ලබා නොගෙන සේවයේ යෙදවීම තහනම්ය.

බී. පී. ඇම්. සේනානායක,
අධ්‍යාපන නිලධාරි තැන, සබරගමු පළාත.

1960 පෙබරවාරි මස 26 වැනි දින,
අධ්‍යාපන කාර්යාලය, රත්නපුර.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ කුරුණෑගල අධ්‍යාපන කායභාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 මාර්තු මස 25 වැනි සිකුරාද පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| (1) කු/කුඹුක්ගහමුල්ල සි. මි. පා. | වහල සෑදීම |
| (2) කු/වැල්ලරාව සි. මි. පා. ... | ගුරු නිවස අළුත්වැඩියාව |
| (3) හලා/මැදගම ජ්‍යෙ. පා. ... | කානු බැඳීම |
| (4) කු/වේරගම සි. මි. පා. ... | පාසැල් ගොඩනැගිල්ල අළුත් වැඩියාව |
| (5) පු/පහල පුලියන්කුලම සි.මි.පා. | ගොඩනැගිල්ල තැනීම |
| (6) කු/පානගමුව මු. පා. ... | වැසිකිළි |
| (7) කු/රඹාවැව පාසැල ... | ළිඳ |
| (8) කු/හළඹේගල පාසල ... | ළිඳ හා වැසිකිළි |
| (9) කු/මීවැල්ලව පාසල | ළිඳ |
| (10) කු/ඉහළ දියදොර සි. මි. පා. | ළිඳ |

සංලක්ෂ්‍යය : කු=කුරුණෑගල දිස්ත්‍රික්කය
හලා=හලාවත දිස්ත්‍රික්කය
පු=පුත්තලම දිස්ත්‍රික්කය

2. රු. 10,000කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රු. 20,000කට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචිවී සිටින අයට අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ කායභාලයේ (ඒ. සී. ශාඛාව) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ අංක 1 සිට 5 දක්වා රු. 100 හෝ අංක 6 සිට 10 දක්වා රු. 10ක ඇප මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන්නාවූ අයට 1960 මාර්තු මස 24 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සි අධ්‍යාපන කායභාලයට පැමිණ අතින්ම භාරදී ටෙන්ඩර් ලබාගත යුතුය. එසේ නැතහොත් එම කුවිතාන්සි සාමාන්‍ය තැපෑලෙන් නොව ලියාපදිංචිකරන ලද තැපෑලෙන් මෙම කායභාලයට එවිය යුතුයි.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් හෝ කොළඹ 2, අධ්‍යාපන අධ්‍යක්ෂකතැනගේ කායභාලයේ (ඇස්. ඩබ්. ශාඛාව) වෙන් හෝ ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරණු ලබන්නේ 2 වන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණකි.

5. පූර්වෝක්ත 2 වන ඡේදයේ සඳහන් වන පරිදි කුරුණෑගල වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමඟය. සියලුම විස්තර තොරතුරු කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් දැන ගත හැකියි. සැලැස්ම එහිදී බලා ගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර “ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, අධ්‍යාපන කායභාලය, කුරුණෑගල” යන ලිපිනයට රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කායභාලයේ කායභාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියකියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නමද, ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

6. 1960 මාර්තු මස 25 වන සිකුරාද පස්වරු 2.30ට කුරුණෑගල අධ්‍යාපන කායභාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම්ද, ප්‍රමාණයන්ද (රේට් ගණන) පැමිණි අයට ඇසෙන්ට කියවනවා ඇත.

7. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන කර සති 6කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

8. වෙනත් අවශ්‍ය විස්තර කුරුණෑගල, වයඹ පළාතේ අධ්‍යාපන කායභාලයෙන් දැන ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැකිය.

9. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා. ලාකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහිම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුයි. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කරණු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩී. එස්. කළුගම්පිටිය,
වයඹ පළාතේ වැ. බ. අධ්‍යාපන නිලධාරීතැන.

අධ්‍යාපන කායභාලය,
කුරුණෑගල, 1960.2.27.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1960 මාර්තු මස 25 වැනි දින පස්වරු 2.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළ යුතු වැඩ |
|---|---|
| කෑ/මාවතගොඩ මධ්‍ය මහා විද්‍යාලය. | ජල සම්පාදනය |

2. රුපියල් 10,000කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි තැනීම සඳහා ලියාපදිංචිව සිටින්නන්ට හෝ රුපියල් 20,000කට හෝ ඊට වැඩි ගණනකට ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිව සිටින්නන්ට හෝ රුපියල් 20,000 කට හෝ ඊට නො අඩු ගණනක ගොඩනැගිලි තැනීමේ කටයුතු භාර ගැනීමට පොහොසත් බවට සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගෙන් හෝ කම්කරු කොමසාරිස් වරයාගෙන් සහතිකයක් අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කරන අනුමත කළ සමුපකාර සමිතිවලට හෝ, ග්‍රාම සංවර්ධන සමිති වලට හෝ කම්කරු සමුපකාර සමිතිවලට 1960 මාර්තු මස 24 වැනි දින පස්වරු 3.30 තෙක් ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ඇත.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, (එස්. ඩබ්ලිව්. ශාඛාවේ) අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ (රත්නපුරේ) සබරගමුව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැක. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ පූර්වෝක්ත 2 වැනි පරිච්ඡේදයෙහි සඳහන් මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

4. පූර්වෝක්ත 2 වැනි ඡෙදයෙහි සඳහන් ප්‍රකාර සබරගමුව පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල අනු පිටපතක් සහිතව ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතු සි. සියලුම විස්තර හා තොරතුරු එතුමාගෙන් ලබාගත හැකි වන අතර සැලැස්ම ද එම කායඹාලයෙහිදී බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර කරුවන් ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතහොත්, වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ටෙන්ඩර් පත්‍ර බහාලන පිට කවරයේ ලියා, මුද්‍රා තැබූ ටෙන්ඩර් පත්‍ර තමාම හෝ තමාගේ නියෝජිතයන් පෞද්ගලිකව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කායඹාල සහායකට භාර දී ඒ බවට ලියවිල්ලක් ඒ භාරදුන් වහාම ලබාගත යුතුය.

5. 1960 මාර්තු මස 25 වැනි දින පස්වරු 2.30ට කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් ද, ගණන් ප්‍රමාණ ද ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට ඇසෙනසේ කියවනවා ඇත.

6. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දින සිට සති 6ක් සවකීය ගණන් යෝජනාව විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර සබරගමුව පළාතේ (රත්නපුරේ) අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි වන අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. ටෙන්ඩර් කරනු ලැබූ වැඩය කිරීම සඳහා නුපුහුණු මෙන්ම පුහුණු ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට තෝරාගත් ටෙන්ඩර්කරුට සිදුවෙනවා ඇත. එවැනි කම්කරුවන් හැකිතාක් දුරට තෝරා ගත යුත්තේ ඒ වැඩ කරනු ලබන ප්‍රදේශයෙනි. ලාංකික කම්කරුවන් පමණක් සහ ටෙන්ඩර් කරනු ලැබූ ප්‍රදේශයේ පදිංචි කම්කරුවන් පමණක් සේවයෙහි යෙදවීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් කරනු ඇත. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩර් කරනු ලැබූ වැඩය කරනු ලබන ප්‍රදේශයේ පදිංචි කරුවන් නොවන ලාංකික කම්කරුවන් සේවයෙහි යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හිදී හැර වෙන මොනම අවස්ථාවකවත් තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් මෙම කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකිරීමක් සේ සළකනු ලබන අතර කොන්ත්‍රාත්තුව අවලංගු වීමටද යටත් වේ. එවැනි සම්මුතිය හා අනුමැතිය නොමැතිව ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩර් කරනු ලැබූ වැඩය කරනු ලබන ප්‍රදේශයේ පදිංචිකරුවන් නොවන කම්කරුවන් සේවයෙහි යෙදවීම තහනම්වේ.

**සංලක්ෂ්‍යය :** කෑ=කෑගල්ල දිස්ත්‍රික්කය.

ක්ලැරන්ස් ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂක වෙනුවට.

1960 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාතීමේන්තුවේදීය.

---

## අධ්‍යාපන දෙපාතීමේන්තුව

වර්‍ෂ 1960 මාර්තු මස 25 වැනි දින පෙරවරු 10.30 වන තෙක් කොළඹ 2 මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළ යුතු වැඩ |
|---|---|
| ගා/ගාලු මහා විද්‍යාලය | දෙමහල් ගොඩනැගිල්ල |

2. රුපියල් 50,000 කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි තැනීම සඳහා ලියාපදිංචිව සිටින්නන්ට හෝ රුපියල් 1,00,000 කට හෝ ඊට වැඩි ගණනකට ආණ්ඩුවේ වැඩ දෙපාතීමේන්තුවේ ලියාපදිංචිව සිටින්නන්ට හෝ, රුපියල් 1,00,000 කට හෝ ඊට නොඅඩු ගණනක ගොඩනැගිලි තැනීමේ කටයුතු භාරගැනීමට පොහොසත් බවට සමූපකාර සමිති රිජිස්ට්‍රාර්ගෙන් හෝ, ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගෙන් හෝ කම්කරු කොමසාරිස් වරයාගෙන් සහතිකයක් අධ්‍යාපන නිලධාරි තැන වෙත ඉදිරිපත් කරන අනුමත කළ සමූපකාර සමිතිවලට හෝ, ග්‍රාම සංවර්ධන සමිතිවලට හෝ කම්කරු සමූපකාර සමිතිවලට 1960 මාර්තු මස 24 වැනි දින පස්වරු 3.30 තෙක් ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ඇත.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, (එස්. ඩබ්ලිව්. ශාඛාවේ) අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ගාල්ලේ, දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත හැක. මුදල් ගෙවීමේ පත්‍ර, නිකුත් කරනු ලබන්නේ පූර්වෝක්ත 2 වැනි ඡෙදයෙහි සඳහන් මුදල් ප්‍රමාණයට ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

